# අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

# ඇබෑර්තු

SLIATE ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ ජනරාල් SLIATE "**ජනවතු පියස**" අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට 2022.02.23 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

## 01. තාක්ෂණ නිලධාරී (සිවිල්) ප්‍රධාන කාර්යාලය (ඇබෑර්තු 01)

**අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

HNDE හෝ NDT සුදුසුකම් සමග (NVQ 6 තලයට නොඅඩු) වසර 02 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :**

MA 2-2-2016 රුපියල් 30,310-10X300-7X350-4X600-20X710-52,360

**සේවා කොන්දේසි :**

1. තෝරාගත් අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල් (EPF) සමාජිකයන් බවට පත් වෙන අතර, ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% ප්‍රමාණයකින් එයට දායක විය යුතුය. SLIATE ආයතනය විසින් ඒ සඳහා 15% ක ප්‍රමාණයක දායකත්වයක් තම අරමුදල් වලින් දරන අතර, එයට අමතරව, සේවක භාර අරමුදලටද (ETF) 3% ක දායකත්වයක් ලබාදෙනු ඇත.
2. අයදුම්කරුවන් සියලු වර්ගීකරණයන් වයස අවුරුදු 25 ට අඩු අය විය යුතු අතර, කෙසේ වෙතත්, රාජ්‍ය/ සේවයේ/ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.
3. රජයේ දෙපාර්තමේන්තු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.
4. රජයේ දෙපාර්තමේන්තුවල සේවය කරනු ලබන විශ්‍රාම වැටුප්වලට හිමිකම ලබන තෝරාගත් අයදුම්කරුවන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඔවුන්ගේ දැනට කරනු ලබන සේවයෙන් නිදහස් කිරීම ලබාගත යුතුය. කෙසේ වෙතත් SLIATE ආයතනයේ සේවයේ කරනු ලබන කාලය තුළ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම නොලැබේ.

අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,**
**අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**